# නිවේදනය A

2019 පෙබරවාරි 07 වැනි දින පාර්ලිමේන්තු සංකීර්ණයේ අංක 06 දරන විදුලි සෝපානය ක්‍රියාවිරහිත වීම නිසා එහි මන්ත්‍රීවරු දොළොස් දෙනෙක් සිරවීම පිළිබඳ පාර්ලිමේන්තු සභා ගර්භයේදී ගරු දිනේෂ් ගුණවර්ධන සහ ගරු විමල් වීරවංශ යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් මතු කරන ලද කරුණ පිළිබඳ ප්‍රකාශයක් කරනු කැමැත්තෙමි.

එම සිද්ධිය සිදු වූ විගස එම විදුලි සෝපානය පිළිබඳ වගකීම දරන නියෝජිතායතය වන සීමාසහිත Aitken Spence Elevators පුද්ගලික සමාගම වෙත දන්වන ලද අතර ඔවුන් විසින් අදාළ විදුලි සෝපානය පරීක්ෂාවට ලක් කර පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ලබා දී ඇත. එම වාර්තාව අනුව මෙම විදුලි සෝපානය ආසන්න වශයෙන් වසර 36ක් පමණ පැරණි බවත් ඒ අවස්ථාවේ දී විදුලි සෝපානයේ බර වැඩි වීම නිසා ක්‍රියාත්මක විය යුතු මයික්‍රො ස්විචය (Micro switch) ක්‍රියාත්මක නොවීම හේතුවෙන්, නාද විය යුතුව තිබූ විදුලි සංඥාව ද ක්‍රියාත්මක නොවූ අතර, එවැනි අවස්ථාවකදී විදුලි සෝපානය ගමන් කිරීමක් සිදු නොවිය යුතුව තිබුණ ද, එය ගමන් කිරීම ආරම්භ වී කෙටි දුරක් ගමන් කර ක්‍රියාවිරහිත වී ඇත.

එකී සමාගමේ පූර්ණ විමර්ශනයට අනුව, පාර්ලිමේන්තු සංකීර්ණයේ සවිකර තිබෙන මෙම විදුලි සෝපාන ආසන්න වශයෙන් වසර 36ක් පමණ පැරණි බැවින් බාධාවකින් තොරව මෙම විදුලි සෝපාන භාවිතා කිරීමේ අතිශය වැදගත්කම සලකා බලා නූතන තාක්ෂණය සහිත නව විදුලි සෝපාන එම පැරණි ඒවා වෙනුවට හැකි ඉක්මනින් සවිකළ යුතු බවට නිර්දේශ කර ඇත.

ඒ අනුව විදුලි සෝපානවල නිතර ගමන් කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා අනෙකුත් අයගේ ආරක්ෂාව තහවුරු කිරීමට හැකිවන පරිදි නවීන පන්නයේ විදුලි සෝපාන එම පැරණි ඒවා වෙනුවට කඩිනමින් සවි කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට දැනටමත් උපදෙස් ලබා දී ඇති බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.